පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.15 පැය 1930 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/743/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

# රුපියල් 5,745,000/- ක මුදලක් සමඟ මුදල් විශුද්ධිකරණය හා විශුද්ධිකරණයට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කිරුළපන පොලිස් වසම

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදුකරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.04.13 වන දින උදෑසන කාලයේ කිරුළපන පොලිස් වසමේ තුන්මෝදර හන්දිය අසලදී, ත්‍රීරෝද රථයක් පරීක්ෂා කර එහි සිටි සැකකටයුතු ලෙස හැසිරුණු පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන කිරුළපන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර විමශර්නයක් ආරම්භ කරන ලදී.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 49 හා 39 වයස් වල පසුවන සිද්ධාර්ථ පාර, කිරුළපන ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**මොවුන් සන්තකයේ තිබි රුපියල් 5,745,000/- ක මුදලක්** සොයාගෙන ඇත. එක් පුද්ගලයෙකු ප්‍රදේශයේ ගෑස් වෙළෙඳසැලක් පවත්වාගෙන යන අතර මොහු නීති විරෝධි මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදී සිටින පුද්ගලයෙකු බවටද සිදුකරන ලද විමශර්න අනුව අනාවරණය වී ඇත.

එක් සැකකරුවෙකු මුදල් විශුද්ධිකරණය කිරීම සම්බන්ධයෙන් හා අනෙක් සැකකරු මුදල් විශුද්ධිකරණයට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇත. මෙම මුදල් නීති විරෝධි මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ගන්නා ලද මුදල්ද එසේ නොමැති නම් එම වෙළෙඳසැල පවත්වාගෙන යාමෙන් උපයාගන්නා ලද මුදල්ද යන්න සම්බන්ධව තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා කිරුළපන පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**